25/04/2012 - ලංකාදීප

දේශපාලකයන්ගෙන් යැපීම වෙනස්කරමුද?

ජීවිත වලට දැනෙන අලූත් යමක් සිදුවිය යුතුය. එවැනි පරිවර්තනයකින් විනා වෙනසක් සිදුනොවේ. ශ්‍රී ලාංකික ජන ජීවිතය හෙම්බත් වී ඇති බව පෙනේ. ඔවුන්ගෙන් වැඩි දෙනෙකුට මහන්සිය දැනේ. එකම චක්‍රය ජීවිතයට විඩාවකි. ධෛර්යය හා ආත්ම ශක්තිය දුර්වල කරයි. එටට අරමුණක් තිබිණ. එය ත්‍රස්තවාදය පරාජය කිරීමයි. රට මහත් විනාශයකට ගෙන ගිය ත්‍රස්තවාදය අභිබවා සාමකාමී දේශයක් ඇති කරන්නට මහජනතාව මහත් අධිශ්ඨානයකින් ක්‍රියා කළේය. ජනාධිපති තුමා ප්‍රමුඛ ආරක්ෂක අංශ එයට පෙරමුණ ගන්නා විට මහජනතාව එකී අරමුණට එකමුතු වූහ. අන්ධකාර යුගය අවසන් විය. අන්ධකාරයෙන් අරුණාලෝකය කරා ගමන් කරන අවස්ථාව තීරණාත්මකය. පවතින අරුණාලෝකය හමුවේ දවස ප්‍රබෝධවත්ව තබා ගැනීමට අරමුණක් අවශ්‍යය. දරුවන් ට අලූත් යුගයක් නිර්මාණය අද දවසේ රටට ඇති එකම අරමුණයි.

ශ්‍රී ලාංකිකයෝ ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියති. ආපසු හැරී බලන විට අවුරුදු දෙදහස් පන්සියයකට වැඩි ලිඛිත ඉතිහාසයක් තිබේ. එකී කාලය තුළ වෙහෙර විහාර, කලා ශිල්ප, ලෝහ ශිල්ප, වාරි කර්මාන්තය, යුද හැකියාව ඇතුළු නොයෙකුත් අංශයක්හි පැතිරගිය දක්ෂතා පෙන්වා තිබේ. ඉතිහාස කතා වලට අනුව මුහුද හා ගුවන සිසාරා සැරිසරන ලද බව ස`දහන්ය. මේවායේ යම් මූලාශ නැතැයි ප්‍රතික්ෂේප කළ නොහැකිය. ශ්‍රී ලංකාවට දැන් තවත් වසර දෙදහස් පන්සියයකට පසු පරම්රාව ගැන අවධානය යොමු කළ යුතුය. එකී අනාගත පරපුර වෙනුවෙන් වර්තමානයේ බිහිවන උරුමය කුමක්ද? නිදහස ලැබූ වකවානුවේ සිය අද දක්වා මෑත ඉතිහාසය නොයෙක් පැති වලින් සලකා බැලිය හැකිය. දේශපාලන ක්‍රමය ස්වකීය මහජනතාව ගෙනැවිත් ඇති මග නිරවුල් චිත්‍රයක් නොවේ. එහි සුන්දර වර්ණ ඇතත් නිරාමිස තෘප්තියක් ඇති නොකරයි. රටට නිසි ගමන් මග කුමක්ද? තවමත් පැහැදිලි නැත. පවතින රාමුව තුළ අනාගත ජයග්‍රහණ පෙන්නුම් නොකරයි නම් රාමුව වෙනස් කිරීමේ උවමනාවක් අපට අවශ්‍යය. ලෝකය ගමන් කරන ආකාරය අනුව ශ්‍රී ලංකාව හුදෙකලා විය නොහැකිය. නව නිර්මාණ සොයා ගනිමින්, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ලෝකයේ සෙසු රටවල් ඉදිරිය බලා ගමන් කරන යුගයක හුරු වූ සම්ප්‍රදායික ගමන සාධාරණ විනිශ්චයකට ලක් කළ යුතුය. යම් ක්‍රීඩා තර`ගයක නිරතවන කණ්ඩායමකට තර`ග සැලසුමක් තිබේ. එය ප්‍රතිවාදීන් පසු බැස්සවීමට සමත් එකකි. සැලසුම ඉවෙන් හ`දුනා ගන්නා ප්‍රතිවාදීන් එයට ප්‍රතිසැලසුමක් සකස් කර ඉදිරියට යන බව පෙනෙන අවස්ථාවක කණ්ඩායමේ නායකයාගේ වගකීම නම් ක්ෂණිකව සැලසුම වෙනස් කිරීමයි. එයින් ප්‍රතිවාදී කණ්ඩායම අසරණ වෙයි. තර`ගය දිනන්නට නම් නිසි අවස්ථාවේ දී නිසි තීන්දුව ගැනීම වැදගත්ය. ශ්‍රී ලංකාව යුද පරිසරයෙන් ඉවත්ව සාමකාමී සැනසිලිදායක යුගයකට අවතීර්ණ වෙමින් තිබේ. රට දියුණු කිරීමේ සැලසුම වෙනස් කිරීමේ තද උවමනාවක් මෙවැනි යුගයක දී පැහැදිලිව පෙනේ. අලූත් පරම්පරාවක්, අලූත් දර්ශනයක්, අලූත් සැලසුම් එහිලා වැදගත්ය. සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රතිසංස්කරණ එහි විශේෂ සාධකයකි.

රාමුව වෙනස් කළ යුතු ඇයි? එය ශ්‍රී ලංකාවේ පමණක් සිදුවන එකක්ද? නැත. ලෝකය පුරා වෙනස්කම් සිදුවෙමින් පවතී. දේශපාලනය, ආර්ථිකය සහ සමාජ ප්‍රවාහය ඉතාමත් වේගයෙන් වෙනස් වෙයි. තාක්ෂණ යුගයේ දී මෙම වෙනස්කම් ඉතාමත් සියුම්ව සිදුවන බව නිරීක්ෂණය කළ හැකිය. මෙකී වෙනස්කම් සිදුකරන්නට හේතු වී ඇත්තේ ඇයි? පවතින රාමුව තුළ තවදුරටත් ගමනක් නැති බව තහවුරු වන අවස්ථාවේ දීය. රටක පාලනයේ දී දේශපාලනඥයන්ට සහ දේශපාලන පක්ෂ වලට විශාල කාර්ය භාරයක් පැවරේ. ජනසමාජයේ උන්නතියට අවශ්‍ය දර්ශනය සපයන්නේ පුලූල් සමාජ දැක්මක් ඇති නායකයන්ය. ජාත්‍යන්තරය දෙස බලන විට දේශපාලන නායකයන් ජන ප්‍රසාදයට පත්ව නැත. ප්‍රජාතන්ත්‍රවාදය බිහිවූ බටහිර රටවල සිට දේශපානඥයන් යම් තරමකින් පිරිහී ගිය චරිතය. ආසියාවේ ද එවැනි තත්ත්වයකි. මහජනතාව දේශපාලනන නායකයෝ මහත් සේ විවේචනය කරති. දේශපාලනඥයන් පමණක් නොව නළු නිලි, ක්‍රීඩක සහ ව්‍යාපාරික අංශයේ නායකයෝ පවා ඉක්මනින් ජනප්‍රිය වන අතර ඉතාමත් ඉක්මනින් මහජන ගෞරවයෙන් ඈත්වෙයි. ජනප්‍රිය අතර ගෞරවය දිනාගත් නායකයන්

විරලය. දේශපාලනයට ඇතුළුවන්නේ මහජන සේවයක් වශයෙනි. මහජනතාව එය අපේක්ෂා කරයි. නමුත් මෙම වකවානුවේ දේශපාලනය මහජන සේවයක් යැයි පොදු ජනතාව පිළිගන්නේ නැත. එය වෘත්තියකි. එය යමක් හරි හම්බ කරගන්නා සහ යැපෙන මාර්ගයකැයි සලකයි. දේශපානඥයන් පමණක් නොවේ. ඔවුන් වටා සිටින කණ්ඩායමක් ද එයින් ජීවත්වෙති. මෙම ක්‍රමය අනුව දේශපාලනඥයා සහ මහජනතාව අතර ඍජු සම්බන්ධය අඩුය. අනුගාමිකයෝ, ආධාරකරුවෝ සහ පාක්ෂිකයෝ එහි වෙති. මෙම පිරිස දේශපාලනඥයා හා දේශපාලන පක්ෂයේ බලය ආරක්ෂා කරගැනීමට වෙහෙසෙති. බලය වටිනාම දෙය වී තිබේ. විරුද්ධ පක්ෂය හා එයට සම්බන්ධ පිරිස නොයෙක් තැත දරන්නේ ද මෙම බලය ලබා ගැනීමටය. බල අරගලයකි. එහි මැද මාවතක් නැත. සාකච්ඡුාවක් සංවාදයක් දුලබය. එකතු වී රටක් ගොඩනගන සැලැස්මකට ඉඩ නැත. හරි දේ හරියට කරන්නට සහභාගී නොවේ. හරි දෙයක වැරදිම දකී. මෙම රාමුවට පිටින් ක්‍රියාකරන දේශපාලනඥයන් වටා කණ්ඩායම් නැත. ඔහු ප්‍රතිපත්ති ගැන කතා කරන විට පාක්ෂිකයන් උනන්දු නැත. මහජනතාව අනුබල නොදේ. අවසානයේ දී එයින් සිදුවන්නේ පුරුදු සමුප්‍රදායික රාමුව ආරක්ෂා කිරීමයි.

දශක හයකට වැඩි කාලයක් පක්ෂ මාරු කිරීමෙන් ශ්‍රී ලංකාවේ තත්ත්වය අපේක්ෂිත තරමට සාර්ථක වි නැත. ප්‍රශ්න එහෙමමය. දරුවන්ට පාසලක්, රැුකියාවක්, ඉඩමක්, ස්ථාන මාරුවක් හැම දෙයකටම දේශපාලන මැදිහත්වීම අවශ්‍යය. දේශපාලන මැදිහත්වීමෙන් ආර්ථිකය දියුණු නොවේ. සමාජ ක්‍රමය වෙනස් වන්නේ ද නැත. එය පසුගිය කාලය තුළ පෙන්වා ඇති සත්‍යයි. මේ දේශපාලනයේ ඇති නරක දකින කිසිවෙකු එයට ඇතුළු වන්නේ එය වෙනස් කරන අරමුණෙන්ය. තද අධිශ්ඨානයක් ඇතිව එයට සූදානම් වන ඕනෑම කෙනෙකු අවසානයේ දී එහි ගොදුරක් බවට පත්වෙයි. රටේ ව්‍යවස්ථාව ප්‍රශ්න හ`දුනාගෙන සකස් කළ එකක් නොවේ. අයිවර් ජෙනිංගස් මහතා නිදහස් ශ්‍රී ලංකාවට ව්‍යවස්ථාවක් සකස් කළේය. එය බටහිර රාමුව අනුව මෙරට විද්වතුන් සමග අදහස් හුවමාරුවෙන්ය. අවස්ථා කිහිපයක දී ව්‍යවස්ථා වෙනස් කළේය. ඒ අවස්ථාවේ බලයේ සිටි කණ්ඩායම තමන්ට අවශ්‍ය ව්‍යවස්ථාව සකස් කළේය. රටට අනන්‍ය, ගැලපෙන ව්‍යවස්ථාවක් අදටත් නැත. ලෝකයේ නොයෙක් රටවල ව්‍යවස්ථා ගැන පාසල් දරුවන්ට පවා අවබෝධයක් ඇත. මහජනතාවගේ ව්‍යවස්ථාවක් වන්නේ ඒ සම්බන්ධ අවබෝධය සමාජයට ඇති අවස්ථාවේ දීය. අප රටේ ව්‍යවස්ථාව සකස් ව ඇත්තේ දේශපාලන පක්ෂ උවමනාව අනුවය. ව්‍යවස්ථාව වෙනස් වූ සෑම අවස්ථාවකම එහි අරමුණ වූයේ පක්ෂ දේශපාලනයේ බලය ආරක්ෂා කර ගැනීමයි.

බිහිකර ඇති සංස්කෘතියට මුල රටේ නායකයින් ගේ් දැක්මයි. සමාජ ප්‍රශ්න පෙන්වන්නේ නායකයින් ගේ තරමයි. එදිනෙදා ප්‍රශ්න විනා දීර්ඝ කාලීනව සලකා ක්‍රියාකරන නායකයන් සමාජයේ විරලය. එය දේශපාලනයේ පමණක් නොවේ. ඕනෑම අංශයක නායකයෝ දැක්මක් ඇතිව සිටිය යුතුය. කලාව සංස්කෘතිය හා මාධ්‍ය තුළ තිබියයුතු පෞර්ෂයය එයයි. මෙම නායකයන්ගේ දැක්ම, ක්‍රියාපටිපාටිය සමාජ පුනරුදයට හේතු වෙයි. අද යුගයට අවශ්‍ය ප්‍රශ්නයක් දෙස මැදහත්ව බලන්නට හැකි නායකයින්ය. හැම දෙයකටම විරුද්ධ නොවෙන තරුණ නායකයින්ය. හැම ක්ෂේත්‍රයකම එවැනි නායකත්ව අංකුර මතු කිරීම අපගේ වගකීමකි. බහු ආගම් බහු සංස්කෘතික ලක්ෂණ සහිත රටක් වශයෙන් තම අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් අන්‍යයන්ගේ ආගමට සංසංකෘතියට ගරු කරන්නට තරම් පුලුල් ද්කිමක් සහිත පරම්පරාවකි. මෙම පරම්පරාව තුළ කාන්තාවන්ට ද නිසි තැනක් හිමි විය යුතුය. ශ්‍රී ලංකාව දේශාලන වශයෙන් කාන්තා ලෝකයට ආදර්ශයක් දුන් බිමකි. අද එය සීමා සහිතය. සෑම අංශයකම කාන්තා නායකත්වය ද අපේ්ක්ෂාකළ යුතුය.

යුද පරිසරය තුළ බිහිවූයේ ගැටුමට දක්ෂ නායකයන්ය. එම වකවානුවේ සමාජයේ ඕනෑම අංශයක ඉදිරියට පැමිණියේ එකී පැත්තයි. ගැටුම, ගැටුම් වාර්තාකරණය, ගැටුම් නිරාකරණය, ගැටුම් උපදේශනය, ගැටුම් සහිත ආර්ථිකයක් කළමණාකරනය එහි නොයෙක් පැතිය. සාමකාමී යුගයේ දී රටට අවශ්‍ය, විවිධ අංශ වලින් නොයෙකුත් හැකියාවන් සහිත නායකයෝ අද රටට ප්‍රමාණවත් නැත. අද ඇත්තේ රික්තයකි. යුග පුරුෂයන් හි`ගය. නිදහස් මතධාරීහු නිහ`ඩය. සමාජ පරිවර්තකයන් අවිනිශ්චිතය. මෙය යුද පරිසරයේ බලපෑමකි. සාමකාමී යුගයේ දී නොයෙකුත් අංශ වලින් නායකයන් හ`දුනාගැනීමට වැඩ පිළිවෙලක් අවශ්‍යය. පාසල් වියේ පටන්ම පරමාදර්ශී චරිත අවශ්‍යය. එම චරිත ගවේශනයෙන් තමනටද නායකයෙකු විය හැකි යැයි සිතන්නට හුරු කරන සමාජ පරිසරයක් අපට ගොඩ නැගිය යුතුව තිබේ. දේශපාලනය පමණක් නොවෙ නොයෙකුත් අංශවල නායකයන් ඇතිකළ හැකිවන්නේ එවැනි පුහුණුවක් මග පෙන්වීමක් මගින් පමණකි. එයට අවශ්‍ය දැනුම අවබෝධය හා පුහුණුව ලබා

දෙන ව්‍යාපාරයක් රටට අවශ්‍යය. බලාපොරොත්තු තැබිය හැකි තරුණ නායකයන් බිහිකරන්නට එය අවස්ථාවකි. යුක්තිය සහ සාධාරණය වෙනුවෙන් පෙනී සිටින නායකයෝ සමාජ සංකේත වෙති. රටට පුලල් දැක්මක් ඇති සමාජ සංකේත හ`දුනාගෙන ඔවුන් දර්ශනයක් සහිත මතධාරීන් ලෙස පෝෂණය කළ යුතුය. රටක් නැගෙන්නේ ඒ අනුවය. දේශපාලන පක්ෂ අනුගාමිකයන් වැඩිවීමෙන් පමණක් රටක් ගොඩනැගිය නොහැකිය. එය වර්තමාන සමාජය පවා කරන බරපතල වරදකි. යැපෙන්නේ දේශපාලනය හා දේශපාලන බලය හා අනුග්‍රහය මතය. දේශපාලන බලපෑම නැතිනම් යමක් කර ගත නොහැකි බව සිතන්නට පටන්ගෙන තිබේ. දේශපාලනයෙන් ස්වකීය බලාපොරොත්තු ඉටු කර ගත හැකියැයි සිතන සමාජයක අනාගතය අ`දුරුය. අප ගමන් කරමින් සිටින්නේ අන්ධකාර යුගයකට පසු අරුණාලෝකය කරාය. එහිදී සමාජ නායකයින්ගේ අභාෂය වැදගත්ය. ආගමික නායකයින්, ගුරුවරුන්, දේශකයන්, පරිවර්තකයන් ඇතුළු නොයෙකුත් දෙනා මෙහි කොටස් කරුවන්ය. පරමාදර්ශී චරිතය. නායකත්වයක් ගෙන ක්‍රියාකරන රියැදුරෙකු හෝ බස් කොන්දොස්තරවරයෙකු රටට අවශ්‍යය. ඔවුන් තම වෘත්තිය සම්බන්ධයෙන් දෙන නායකත්වය අනාගතය ගොඩනගයි. දේශපාලනඥයෙකු ගේ නායකත්වයට වඩා සමාජය ඔහුගේ සේවය අගය කළ යුතුය. සාධාරණ වෙළ`ඳාමකට, සාධාරණ නිෂ්පාදනයකට නායකත්වය දෙන පුරවැසියෙකු රටට ආඩම්බරයකි. මෙවැනි ආකල්ප වෙනසකින් තොරව රටට ඉදිරියට යා නොහැකිය.

පවතින රාමුව වෙනස් කිරීමේ වගකීම ඇත්තේ අප සතුවය. අප සියලු දෙනා මෙම ක්‍රීඩාවේ කොටස්කරුවන්ය. තවත් ක්‍රීඩකයෙකු දිනා දෙන ලකුණකින් රට දිනවන්නට වඩා තමන් ද ලකුණු උපයා ගන්නට උත්සාහ කළ යුතුය. යැපෙන්නෙකු නොව නායකයෙකු විය යුතුය. මෙවැනි නායකත්ව බිහිකරන පසුබිමක් රටට අවශ්‍යම යුගයක් කරා අද සේන්දු වී සිටී. පරණ සම්ප්‍රදායික මාවතේ ගමන් කළ හැකිය. අතීතය දෙස ආපසු හැරී බැලීමේ දී විලාශය වෙනස් නොකිරීමෙන් රටට සිදුවූ හානිය අවබෝධ කරගත යුතුය. තරුණ අපේක්ෂා, ඔවුන්ගේ බලාපොරොත්තු ඉටුකරන්නට නම් ඔවුන් අතරින් නායකයන් සොයා ගැනීම වැදගත්ය. සමාජ නායකයන් ස්වකීය පදනම සකස් කරගන්නා විට අනාගත පරපුර දේශපාලනඥයන් මත යැපෙන්නේ නැත. සමාජ විප්ලවය සිදු විය යුත්තේ පවතින ක්‍රමය වෙනස් කිරීමටය. ක්‍රමය වෙනස් කරන්නට සන්නද්ධ විප්ලව පැන නැගුණ අවස්ථාවල රටට අහිමි වූයේ නායකයන් විය හැකි තරුණ පරපුරකි. අවස්ථා කිහිපයක රටට අහිමි වූ චරිත අද ඉතිරිව සිටියා නම් ඕනෑම අංශයක නිරත නිදහස් මතධාරීහු කණ්ඩායමක රට හමුවේ සිටී. අවාසනාව එම වෙනසක් ඇතිකිරීමේ කැකැරෙන ධෛර්යයෙන් යුතු ජීවිත රටට අහිමිවීමයි. රට තුළ ඇති ප්‍රශ්න හ`දුනාගෙන ඒවාට අවශ්‍ය විස`දුම නිර්මාණය කිරීම දේශපාලනඥයන්ට හා දේශපාලන පක්ෂ වලට පමණක් කළ හැකි දෙයක් නොවේ. දේශපාලනයට ඒ ස`දහා ප්‍රමාණවත් ධාරිතාවක් නැත. එක් එක් අංශ වෙනුවෙන් නිසි දැක්මක් ඇති නායකයන්ට තීරණ ගෙන සමාජයට දර්ශනයක් සැපයීමේ වගකීම පැවරීම අවශ්‍යය. එය පහසු නැත. අභියෝගයකි. මෑත භාගය තුළ සම්ප්‍රදායික නායකයින් ගේ බලපරාසය ආක්‍රමණය කරන පෙරළියකි. එවැනි පරිවර්තනයකට කාලය උදා වී තිබේ. යම් පෙරළියකින් තොරව තවත් අලුත් යුගයක් ගොඩනැගීම අපහසුය. මේ ගැන ඔබගේ අදහස ැප්සක?පසකසබා්ගදරට මගින් සංවාදයට යොමු කළ හැකිය.

මිලින්ද මොරගොඩ